වහාම ක්‍රියාත්මක වන පරිදි එකතු කළ අගය මත බද්ද (VAT) 8% සිට 12% දක්වා 4%කින් සහ, විදුලි සංදේශ බද්ද 11.25% සිට 15% ක් දක්වා ඉහළ දමමින් රජය විසින් මැයි 31, 2022 දින සිදුකළ නිවේදනය එදින රාත්‍රී රූපවාහිනී සිංහල ප්‍රධාන පුවත් විකාශයන් ඔස්සේ ආවරණය වී තිබිණි.

එහිදී, රූපවාහිනී පුවත් සිරස්තල තුළ මෙම බදු වැඩිවීම පිළිබඳව වාර්තා වී තිබුණේ මෙසේයි.

(මෙම දත්ත සටහන සඳහා භාවිතා වී ඇත්තේ මැයි 31, 2022 රූපවාහිනී රාත්‍රී ප්‍රධාන සිංහල පුවත් විකාශයන් පමණක් වේ. එදින ජාතික රූපවාහිනී පුවත් සිරස්තල තුළ මේ පිළිබඳව වාර්තා නොවූ අතර, පුවත් අන්තර්ගතය තුළ පමණක් මේ පිළිබඳව වාර්තා වී තිබිණි. එහෙයින් ජාතික රූපවාහිනී ඇතුළත පුවතේ ආරම්භය උපුටා ගෙන ඇත.)